මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
மோட்டார் போக்குவரத்துத் திணைக்களம்
DEPARTMENT OF MOTOR TRAFFIC

DMT
Drive Sri Lanka

තැ. පෙ. අංක 533 - 341, ඇල්විටිගල මාවත, කොළඹ 05.
த. பெ. இல. 533 - 341, எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05.
P. O. BOX No. 533 - 341, ELVITIGALA MAWATHA, COLOMBO 05.

මගේ අංකය / எனது இல. / My No. DMT/H/TEC/GEN/2022

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.11.10

මෝටර් රථ ආනයනකරුවන්,නිෂ්පාදකයින්,එකලස් කරන්නන් හා ගරාජ් හිමියන් වෙත

මහත්මයාණෙනි/මහත්මියෙනි,

**<u>මෝටර් රථ ආනයනය ,නිෂ්පාදනය හා එකළස් කරනු ලබන ආයතන සහ ගරාජ් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම -2023</u>**

2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම 2022.12.01 දින සිට ආරම්භ කරනු ලැබේ. 2023.01.15 දිනට ප්‍රථම ඔබගේ වෙළඳ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

02. 2022 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබාගෙන ඇත්නම් ,2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබා ගැනීමට මේ සමඟ අමුණා ඇති අයදුම් පත්‍රය හා පහත සඳහන් ලේඛන ද සමඟ 2023.01.15 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්,2023.01.15 දිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී ප්‍රමාද ගාස්තු අය කිරීමට සිදුවන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

I. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක්,හවුල් ව්‍යාපාරයක් නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර සහිත 20 ආකෘතිය(FORM 20)

II. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් බදු නිෂ්කාශන වාර්තාව(TAX CLEARANCE CERTIFICATE)

III. බලපත්‍රය නිකුත් කරනුයේ වාර්ෂිකව බැවින්, ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන භූමියේ අයිතිය අවම වශයෙන් අදාළ වර්ෂයට පමණක් හෝ වලංගු වන පරිදි ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද සින්නක්කර ඔප්පුවක ,බදු ගිවිසුමක හෝ කුලී ගිවිසුමක පිටපතක්.

IV. අයදුම්කරු එම ස්ථානීය ලිපිනයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන බවටත්,සින්නක්කර ඔප්පු, බදු ගිවිසුම් හෝ කුලී ගිවිසුම්වල විස්තර හා ආදායම් බදු අංක හා ගෙවීම් සම්බන්ධ තොරතුරු ඇතුළත් කළ දිවුරුම් ප්‍රකාශයක්.

V. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක් හෝ සමාගමක් නම් හවුල්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත්වල සහතික කළ පිටපත්.

VI. අදාළ ගාස්තු සමඟ පසුගිය වර්ෂයට ලබා ගත් ගරාජ් අංක තහඩු සහ ලියාපදිංචි සහතිකයේ පිටපතක්.

නිශාන්ත අනුරුද්ධ වීරසිංහ

මෝටර රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

පිටපත් 1. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - බදු නිෂ්කාශන වාර්තාව(TAX CLEARANCE CERTIFICATE) නිකුත් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලමි.

2. කොමසාරිස්(සංවර්ධන) - කා.දැ.ස හා අ.ක.ස(දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීමට)



කොමසාරිස් ජනරාල් / ஆணையாளர் நாயகம் / Commissioner General 0112690122
අතිරේක කොමසාරිස් / மேலதிக ஆணையாளர் / Additional Commissioner 0113071568
පරිපාලන නිලධාරි / நிர்வாக அலுவலர் / Administrative Officer 0112693765
ෆැක්ස්/தொலைநகல்/Fax 0112694338
ෆැක්ස්/தொலைநகல்/Fax 0112698316
කාර්යාලය / அலுவலகம் / Office 0112033333
විදුලි පණිවුඩ / தந்தி / Telegrams — මෝටර්යකො / மோட்டார்ஸ் / MOTORS
E-mail : cg@dmt.gov.lk
Web : https://dmt.gov.lk